# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 03 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 திகதி | දිනය<br>Date | 01/01/2024<br>පැය 1310 |

## මාධ්‍ය නිවේදනය

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - රස්නායකපුර පොලිස් ස්ථානය.**

2023.12.31 වන දින අළුයම් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ මොන්නෑකුලම, හලඹේ ප්‍රදේශයේදී රස්නායකපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන මොන්නෑකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රස්නායකපුර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය.**

2023.12.31 වන දින අළුයම් කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ කුඩා ගම්මාන ප්‍රදේශයේදී ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මැදවච්චිය පොලිස් වසම.**

2023.12.31 වන දින රාත්‍රී කාලයේ මැදවච්චිය පොලිස් වසමේ මැදවච්චිය මන්නාරම මාර්ගයේ මහසියඹලාගස්කඩ ප්‍රදේශයේදී සෙට්ටිකුලම දෙස සිට මැදවච්චිය දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගයේ ගමන් ගත් පදිකයින් දෙදෙනෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයින් දෙදෙනා

සෙට්ටිකුලම රෝහලට ඇතුලත් කිරීමේදී එක් පදිකයෙක් මියගොස් ඇත. මියගිය අයගේ සහෝදරයෙක් වන අනෙක් පදික පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා වව්නියාව රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ මහසියඹලාගස්කඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය සෙට්ටිකුලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ලොරි රථ රියදුරු අනතුරින් පසු පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**